ශීර්ෂය 105 - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය
**යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2. කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව |
| 305 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.107,509,495,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.93,823,266,007 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවෙහි ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.2,471,524 ත් රු.12,866,453,529 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.35 සිට සියයට 67.63 ක් දක්වා පරාසයක පැවතින. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු | රු. | රු | රු. | රු |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 9,906,377,000 | 85,005,363,000 | 9,846,613,355 | 72,198,673,116 | 59,763,645 | 12,806,689,884 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 11,093,350,000 | 38,400,000 | 10,978,819,076 | 2,843,781 | 114,530,924 | 35,556,219 |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 150,110,000 | 763,425,000 | 146,152,258 | 149,515,831 | 3,957,742 | 613,909,169 |
| 305 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 16,115,000 | 1,225,000 | 13,912,950 | 955,526 | 2,202,050 | 269,474 |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 174,880,000 | 360,250,000 | 174,316,716 | 311,463,398 | 563,284 | 48,786,602 |
| | එකතුව | 21,340,832,000 | 86,168,663,000 | 21,159,814,355 | 72,663,451,652 | 181,017,645 | 13,505,211,348 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත පහත දැක්වෙන පරිදි රු.45,457,667,395 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ගම නැගුම | 13,478,000,000 | 12,955,247,074 | 522,752,926 |
| සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය | 800,000,000 | 584,558,668 | 215,441,332 |
| ග්‍රාමීය පෙර පාසල් ප්‍රචලිත කිරීම | 400,000,000 | 255,609,907 | 144,390,093 |
| උතුරු වසන්තය | 532,000,000 | 302,899,830 | 229,100,170 |
| නැගෙනහිර නවෝදය | 472,000,000 | 171,094,989 | 300,905,011 |
| සබරගමු අරුණාලෝකය | 2,048,000,000 | 1,841,068,646 | 206,931,354 |
| රජරට නවෝදය | 2,110,000,000 | 1,986,357,983 | 123,642,017 |

| | | | |
|---|---|---|---|
| කඳුරට උද්‍යානය | 1,567,000,000 | 969,725,516 | 597,274,484 |
| වයඹ පුබුදමු | 1,693,000,000 | 1,643,669,645 | 49,330,355 |
| පුබුදමු වෙල්ලස්ස | 2,100,000,000 | 1,984,508,681 | 115,491,319 |
| බටහිර රන් අරුණ | 2,952,000,000 | 2,831,084,183 | 120,915,817 |
| රුහුණු උද්‍යානය | 2,309,000,000 | 2,007,913,230 | 301,086,770 |
| නැගී එන කලාප කටයුතු | 14,996,667,395 | 12,657,972,221 | 2,338,695,174 |
| එකතුව | 45,457,667,395 | 40,191,710,573 | 5,265,956,822 |

**(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ සහ කාර්යාල විසින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පහත සඳහන් පරිදි එකතුව රු.22,225,000 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය/කාර්යාලය | ලබා දුන් ප්‍රතිපාදනය | උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 750,000 | 742,632 | 7,368 |
| ජනාධිපති කාර්යාලය | 13,300,000 | 12,853,302 | 446,698 |
| අග්‍රාමාත්‍ය කාර්යාලය | 5,000,000 | 4,986,896 | 13,104 |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 3,175,000 | 3,174,691 | 309 |
| | 22,225,000 | 21,757,521 | 467,479 |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා 20.30.02.19 දරන ආදායම් සංකේතය යටතේ රු.300,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ආදායම ලෙස රු.373,171,029 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 124 ක ආදායමක් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 04 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 105 | 10501 | 120,000,000 | 102,074,263 | 60,000,000 | 89,332,492 | 438,000,000 | 283,436,868 |
| 218 | 21801 | 12,000,000 | 9,777,871 | 9,000,000 | 11,222,942 | 90,000,000 | 51,948,767 |
| 294 | 29401 | 18,500,000 | 9,829,119 | 8,000,000 | 13,530,752 | 56,000,000 | 42,488,310 |
| 305 | 30501 | 2,200,000 | 1,311,225 | 800,000 | 1,415,178 | 8,000,000 | 5,630,991 |
| 322 | 32201 | 20,000,000 | 14,330,346 | 8,500,000 | 12,652,989 | 60,000,000 | 47,709,865 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 04 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.188,349,927 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0019/000 | 92,383,062 |
| සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0099/000 | 5,879,061 |
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0149/000 | 80,085,161 |
| උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0160/000 | 2,300,593 |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0167/000 | 7,702,050 |
| එකතුව | | 188,349,927 |

## 2 කොටස

## එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. ශීර්ෂය 105 - ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

#### 1.1 විගණන විෂය පථය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

#### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

#### 1.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සහ මූලධන වැය විෂයයන් 12 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.2,941,960,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ii) පුනරාවර්තන වැය විෂයයන් 08 ක් සහ මූලධන වැය විෂයයන් 12 ක් වෙනුවෙන් එකතුව රු.53,410,950,000 ක් වූ අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එකතුව රු.50,972,347,215 ක් උපයෝජනය කළ පසු රු.2,438,602,785 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සහ මූලධන වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.5,158,800,000 ක් වූ ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 හි විධිවිධාන අනුව රු.2,177,800,000 ක් හෙවත් සියයට 42.22 ක් වෙනත් වැය විෂයයන්වලට මාරු කිරීමෙන් පසුවද එම වැය විෂයයන්ගෙන් රු.2,086,819,706 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 40.45 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් යටතේ රු.1,934,500,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණත්, එම ප්‍රතිපාදනයෙන් සියයට 1.76 ක් හෙවත් රු.34,117,372 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම නොලැබීම නිසා මෙම ඉතිරිය සිදු වී ඇති බව අමාත්‍යාංශයේ ලේකම්වරයා මා වෙත වාර්තා කර තිබුණි.

(v) විදේශ අරමුදල් මගින් මූල්‍යනය කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතින් 04 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදනයන් සළසා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව රු.17,010,176 ක් වූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එසේ සළසා ගෙන තිබුණු ප්‍රතිපාදනයෙන් රු.984,488 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර රු.16,025,688 හෙවත් සියයට 94.2 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම සීමා

වීම නිසා මෙම අතිරේක ප්‍රතිපාදන අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා ගැනීමට නොහැකි වූ බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මා වෙත වාර්තා කර තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.92,383,062 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ දෙකකට වැඩි කාලයක් මුළුල්ලේ පැවති එකතුව රු.37,143,872 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයෙන් රු.5,716,193 ක් 2013 නොවැම්බර් මාසයේදී රජයේ ආදායමට බැර කර තිබුණු අතර සමහර තැන්පතු සංවර්ධන ව්‍යාපෘතිවල රඳවුම් ලෙස තබාගෙන ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 10501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වර්ෂ දෙකකට වැඩි කාල සීමාවක සිට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,996,837ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. එම ශේෂ තුළ පැවති රු.1,552,610 ක් වූ ණය ශේෂ පොත්වලින් කපා හැරීමට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලීමක් කර තිබුණි.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවකයෙකු 2011 නොවැම්බර් මස සිට වැඩ තහනමට ලක් වී තිබුණි. ඔහුගෙන් අයවිය යුතු රු.93,160 ක ණය ශේෂය අයකර ගැනිම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) 2008 අප්‍රේල් 08 දින සිට සේවය හැරයාමෙන් පසුව මියගිය නිලධාරියෙකුගෙන් රු.332,331 ක් දේපල ණය ශේෂයයක් රජයට අයවීමට තිබුණි. එම නිලධාරියා මියයන විටත් සේවය හැරයාමේ නියෝග නිකුත් කර තිබූ බැවින් මරණ පාරිතෝෂිකයද හිමි වී නොතිබුණි. එම ණය මුදලට අදාල අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රයද ලියාපදිංචි කර නොතිබුණි. එම ණය ශේෂය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය ප්‍රකාරව නීතිපතිගෙන් උපදෙස් ලබා ගෙන නොතිබුණි.

(iv) මහනුවර දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලයේ සේවයේ නියුක්තව සිට වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකු සම්බන්ධයෙන් වූ විනය පරීක්ෂණ කමිටු වාර්තාවට අනුව විශ්‍රාම වැටුප හා පාරිතෝෂිකය අහිමි කර ඇති බැවින් නිලධාරියාගෙන් රජයට අයවිය යුතු රු.64,314 ක ණය ශේෂය 2012 දෙසැම්බර් 31 දින වන විටත් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) 2001 වර්ෂයේදී විදේශ නිවාඩු ලබා නිවාඩුවෙන් පසු නැවත සේවයට වාර්තා නොකරන ලද නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.1,076,581 ක් සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- එක් නිලධාරියෙකුගේ දේපල ණය ගොනුව අස්ථානගත වී තිබූ අතර ණය මුදල් නොගෙවීම නිසා එම නිලධාරියාගේ නම අසාධු නාම ලේඛනයට ඇතුළත් කිරීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි.

- අනෙක් නිලධාරියාගේ ණය මුදලින් මිලට ගත් දේපල වලට අදාල ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීමට ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11:9 වගන්තිය ප්‍රකාරව ණය අනුමත කළ බලධාරියා විසින් අපොහොසත් වී තිබුණි. 2013 ජූලි 31 දින වන වන විටත් එම දේපලෙහි ඇටෝනි බලපත්‍රය ලියාපදිංචි කිරීමට ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(vi) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම යටතේ ලබා දෙන ණය අත්තිකාරම් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පමණක් ලබාදිය යුතු වුවත්, කිලිනොච්චිය හා මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාල දෙක විසින් 2011 සහ 2012 වර්ෂයන් හිදී නිලධාරීන් කිහිප දෙනෙකුට පොලී රහිත වසර දෙකක විශේෂ වැටුප් ණය මුදල් ලබා දී තිබුණි. 2011 ඔක්තෝබර් 20 දිනැති අංක බීඩී/ජීපීඑස්/ඒඒ/2001/එස් දරන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් මෙසේ පොලී රහිත වසර දෙකක වැටුප් ණය ලබා නොදෙන ලෙසත් එසේ ලබා දුනහොත් එය අනෙකුත් සියළුම රජයේ සේවකයන්ට පූර්වාදර්ශයක් වන බවත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාට දන්වා තිබියදී එම දැන්වීමෙන් පසුවද එම

දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂවරුන් විසින් මෙම ණය මුදල් ලබාදී තිබුණි. ඒ අනුව රාජ්‍ය මුදල් පාලනය සම්බන්ධයෙන් වන නීති, රීති හා රෙගුලාසි කඩ කිරීම සහ මහා භාණ්ඩාගාරයේ උපදෙස් නොසළකා කටයුතු කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ජේදයේ 8.1 වගන්තිය අනුව කටයුතු කළ යුතු අතර ගෙවන ලද ණය මුදල් ද එකවර අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. ගෙවන ලද ණය මුදලේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 4,075,159 ක් විය.

(vii) අමාත්‍යාංශයේ සංවර්ධන ක්ෂේත්‍ර සහකාර තනතුර දැරූ නිලධාරියෙකු ද්විතීක පදනම යටතේ විදේශාධාර ව්‍යාපෘතියක රාජකාරී කළ අතර එම සේවා කාලය නිමවීමෙන් පසුව 2012 දෙසැම්බර් 31 දින වන විටත් නැවත සේවයට වාර්තා කර නොතිබුණි. එම නිලධාරියාගෙන් අයවිය යුතු රු.11,266 ක් වූ ණය ශේෂයක් සහ අදාල පොලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2013 ජූලි 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනම සංයුක්ත සැලැස්මක් සකස් නොකරන අතර මුදල් අමාත්‍යාංශය මගින් සකස් කරනු ලබන මධ්‍යකාලීන ආයෝජන සැලැස්ම /මහින්ද චින්තන සංවර්ධන ප්‍රතිපත්ති රාමුව යටතේ නිශ්චිත මුදල් වර්ෂයට සහ ඊළගට එළඹෙන මුදල් වර්ෂ දෙක සඳහා ඒ ඒ සංවර්ධන ව්‍යාපෘති යටතේ ඇස්තමේන්තු කර ඒ අනුව වාර්ෂික වැඩ සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

### 1.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණේ සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමෙන් තොරවය.

2014-2016 කාලපරිච්ඡේදයට මහින්ද චින්තන දැක්ම යටතේ මුදල් අමාත්‍යාංශය සකස් කළ රාජ්‍ය ආයෝජන උපාය මාර්ග සැලැස්ම, සංයුක්ත සැලැස්ම සේ සළකා ඒ යටතේ ඇති අරමුණු ජයගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන බවත් එය වඩාත් ප්‍රායෝගික හා ප්‍රශස්ත ක්‍රමවේදයක් ලෙස මෙම අමාත්‍යාංශය හඳුනාගෙන ඇති බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| උපකරණය | ඒකක ප්‍රමාණය | වත්කම පවතින ස්ථානය | නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත |
|---|---|---|---|
| කැමරා<br>කැසට් යන්ත්‍ර | 1<br>1 | කෑගල්ල, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ඌන උපයෝජිතව පැවැතීම<br>නිෂ්ක්‍රීයව පැවැතීම |
| ක්‍රීඩා භාණ්ඩ | 232 | මාතලේ, යටවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ඌන උපයෝජිතව පැවැතීම |
| ළදරු පාසැල් උපකරණ | | මහනුවර, උඩුනුවර ප්‍රාදේශීය සභාව | ඌන උපයෝජිතව පැවැතීම |
| ඇදි සහිත කුෂන් පුටු<br>වානේ අල්මාරි | 21<br>04 | මහනුවර, උඩ පලාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඌන උපයෝජිතව පැවැතීම |
| එල්සීඩී රූපවාහිනී යන්ත්‍ර<br>ඩීවීඩී යන්ත්‍ර | 02<br>02 | මහනුවර, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ඌන උපයෝජිතව පැවැතීම |

### (ආ) රජයේ වෙනත් ආයතන වෙත දී ඇති වත්කම්

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සපයා ගැනීම සඳහා 2011 ජුනි 09 දිනැති අංක අමප/11/1236/519/019 දරන අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි China National Aero-Technology Import and Export Corporation ආයතනය වෙතින් එක්සත් ජනපද ඩොලර්

115,853,892.69 කට යන්ත්‍රොපකරණ 725 ක් ණය පදනම මත ලබා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5.3 ඡේදය ප්‍රකාරව මෙම විදේශාධාර ණය (උපකරණ ණය) ගිණුම්ගත කර නොතිබුණි.

(ii) ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ශ්‍රී ලංකාවට වාසිදායක වන පරිදි China National Aero-Technology Import and Export Corporation ආයතනය සමඟ ඔවුන්ගේ මූල්‍ය ලංසු පිළිබඳ කොන්දේසි සාකච්ඡා කිරීමට හා ණය ගිවිසුම් අත්සන් කිරීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ට බලය පවරා තිබුණත්, අත්සන් කරන ලද ණය ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක අත්තිකාරම් ගෙවිය යුත්තේ එම ණය ගිවිසුම අත්සන් කළ පසුව බව දක්වා තිබුණත්, ගෙවා තිබුණු අත්තිකාරම් මුදලේ වලංගුභාවයද එම ගිවිසුම ඉදිරිපත් නොකිරීමෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය.

(iii) 2011 හා 2012 වර්ෂවලදී මෙම යන්ත්‍රෝපකරණ ණය වෙනුවෙන් ණය වාරික වශයෙන් පිළිවෙලින් රු.මිලියන 1,190 ක් හා රු.මිලියන 1,850 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,040 ක් ගෙවා තිබුණි. එය වියදම 3001 වැය විෂය යටතේ ගිණුම්ගත නොකර 2502 වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. එසේම එම ණය වෙනුවෙන් 2012 වර්ෂයේදී ගෙවා තිබුණු රු.මිලියන 453 ක පොලිය 1602 වැය විෂය යටතේ ගිණුම්ගත නොකර 2502 වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(iv) අමාත්‍යාංශය විසින් ලබා ගෙන තිබුණු රු.14,504,000,000 ක් වටිනා එම යන්ත්‍රෝපකරණ පහත දැක්වෙන රජයේ ආයතන වෙත මුදාහැර තිබුණි.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | | රු. (මිලියන) | |
| i. පිරියත | 49 | • රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව<br>• ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය<br>• රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව<br>• මාර්ග සංවර්ධන අධිකාරිය<br>• බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>• දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>• ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යාංශය<br>• ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 14,504 | 2011 නොවැම්බර් සිට |
| ii. යන්ත්‍ර සූත්‍ර | 676 | | | |
| iii. යන්ත්‍ර සඳහා අමතර කොටස් | - | | | |
| | ----- | | --------- | |

| | 725 | 14,504 |
|---|---|---|

**1.6 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 703(2)(ආ) | 2,746,405 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනුමත සමිතිවලට කොන්ත්‍රාත් පැවරීමෙන් පසුව එම සමිති විසින් වෙනත් පුද්ගලයන්ට අතුරු කොන්ත්‍රාත් දී තිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2010 මැයි 24 දිනැති අංක 08/2010 දරන චක්‍රලේඛයෙහි 10.7 ඡේදය | 109,020 | ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට හිමි මාසික ඉන්ධන දීමනාවලට අතිරේකව නිලධාරීන් තිදෙනෙකුගේ බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ii) 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන චක්‍රලේඛයෙහි 10.7 ඡේදය | - | 2012 වර්ෂයේදී විදේශ ගමන්වල යෙදුනු නිලධාරීන් 48 දෙනෙකුගේ විදේශ ගමනට අදාල තොරතුරු හා ඔවුන් විසින් අදාල අවස්ථාවන්හිදී රජය සමඟ එළඹුනු ගිවිසුමේ පිටපතක් සහිතව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිලධාරියා අයත් සේවයට අදාල පරිපාලන බලධරයා වෙත වාර්තා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ඈ) කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | |
| 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛය | - | දක්වා ඇති සුදුසුකම් වලින් පරිබාහිර සුදුසුකම් මත CARE ව්‍යාපෘති මෙහෙයුම් කාර්යාලය සඳහා නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |
| **(ඇ) වෙනත් චක්‍රලේඛ** | | |
| (i) 2012 ජූලි 10 දිනැති අංක 2/2012 දරන දිවි නැගුම චක්‍රලේඛයේ 5.1.2 ඡේදය | 1,019,875 | දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ පැල ලබාදීමේදී ඒ සඳහා ප්‍රතිලාභීන්ට ලබාදෙන පැල සඳහා ලේඛනයක්, පහසුකාරකයන් ලෙස කටයුතු කරන නිලධාරීන්ට ලබාදුන් පැල හා රෝපන ද්‍රව්‍ය සටහන් කිරීමට වාර්තා පොතක්, ප්‍රතිලාභීන් පැල ලබාගත් බවට තහවුරු කෙරෙන අත්සන් ලේඛනයක් පවත්වා ගැනීම හා තවාන්වල ඇති පැලවල ගුණාත්මක තත්ත්වය සහතික කර ගැනීම කළ යුතු වුවත්, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2012 වර්ෂයේදී එසේ බෙදාදුන් රු.1,019,875 ක් වටිනා පැල සම්බන්ධයෙන් ඉහත විධිවිධාන අනුගමනය කර නොතිබුණි. |
| (ii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 6(1)(අ) උපවගන්තිය | 24,873,873 | රන් අරුණ වැඩසටහන යටතේ ඉදිකළ ගම්පහ ඕරුතොට ශරීර සුවතා ඇවිදින මං තීරුව ව්‍යාපෘතියට අදාල රු.24,873,873 ක් වටිනා කොන්ත්‍රාත්තු 02 ක් පිළිබඳව කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු, පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කර නොතිබුණු අතර කොන්ත්‍රාත්තුව පිරිනැමූ දින සිට දින 60 ක් තුළ කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචිද කර නොතිබුණි. |

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ගෘහස්ථ කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තයට රු.570,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2012 දෙසැම්බර් 31 දින වන විටත් ඇඟළුම් නිෂ්පාදනය සඳහා ලද ප්‍රතිපාදන කිසිවක් උපයෝජනය කර නොතිබූ අතර පහත දැක්වෙන හේතු නිසා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(i) ඇඟළුම් නිෂ්පාදනය සඳහා එක් ප්‍රතිලාභියෙකුට ලබා දෙන උපරිම මුදල රු.10,000 ක් වීම නිසා උපකරණ මිල රු.10,000 කින් ඉක්මවීමේදී අවශ්‍යවන ඉතිරි මුදල් සපයා ගැනීමට ප්‍රතිලාභීන්ට හැකියාවක් නොතිබුණි.

(ii) ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරනු ලබන මිල ගණන්වලට වඩා අඩු මිලකට වෙනත් ආයතනවලින් එම භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට හැකියාවක් පැවැතුණි.

### (ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| බදුල්ල දිස්ත්‍රික්කයේ නවගම්මාන මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000 | 2012.09.18 | 2012.06.20 | 300,000 | ද්‍රව්‍ය ප්‍රවාහන අපහසුතා |
| (ඇ) මුදල් වැය කෑගල්ල, දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොරයාවංගුව වැලිකන්ද මාර්ගයෙහි පැති බැම්ම හා මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000 | 2012.08.10 | 2012.10.10 | ගෙවා නැත | දිස්ත්‍රික් ඉංජිනේරු විසින් ස්ථානීය පරීක්ෂාවේදී පෙන්වා දුන් අඩුපාඩු සම්පූර්ණ නොකිරීම නිසා බැම්ම මුළුමනින්ම ගැලවී, පාරට වැටී තිබුණි |

(ඇ) **මුදල් වැය කර තිබූ නමුත් නිසි ප්‍රතිලාභයක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් පරිදි ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කර තිබුණත් කාර්යභාරයේ ප්‍රගතියක් නොතිබුණු අවස්ථා කීපයක් නිරීක්ෂණය විය.

(i) 2012 වර්ෂයේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බණ්ඩාරවත්ත - මිරිස්වත්ත මාර්ගයේ රු.709,936 ක වියදමින් කොන්ක්‍රීට් පැති කාණු ඉදිකිරීමේදී ඒවා කොටස් ලෙසින් තැනින් තැන ඉදිකිරීමත් නිවෙස්වලට පිවිසුම් ස්ථානවලදී පොරොන්දු වූ පරිදි නිවැසියන් විසින් හියුම් පයිප්ප යොදා නොතිබීමත් නිසා ක්‍රමානුකූලව ජලය බැසයාමක් සිදු වී නොතිබුණි.

(ii) 2012 වර්ෂයේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඹුල්ගොඩ - ගනේමුල්ල මාර්ගයේ රු.779,508 ක වියදමින් කොන්ක්‍රීට් කානු ඉදිකර අවසන් වී මාසයක් ඉක්ම යාමට ප්‍රථම ඒවායේ නඩත්තුව දුර්වලවීම නිසා අවට ගස් වැවී කානු හා බෝක්කු තුළ පස් තැන්පත් වීමෙන් ක්‍රමවත් ලෙස ජලය ගලා බැසීමක් සිදු වී නොතිබුණි.

(iii) 2012 වර්ෂයේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කසගහවත්ත - ඉහලගම මාර්ගයේ රු.629,315 ක වියදමින් ඉදිකර තිබූ කොන්ක්‍රීට් කානුව අවසන් වන ස්ථානයේ ඉඩමේ හිමිකරු විසින් කානුව අවහිර වන පරිදි විශාල ගල් හිර කිරීම නිසා රැස්වන ජලය බැසයාම අවහිර වී තිබුණු අතර ඒ සඳහා වැයකළ මුදලින් අපේක්ෂිත ප්‍රතිඵල අත් කර ගෙන නොතිබුණි.

(iv) දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් ග්‍රාම නිලධාරී වසමක් තුළ පවුල් 17 ක් සඳහා ගෘහාශ්‍රිත කුකුළු පැටවුන් 170 ක් බෙදාදීම සහ කුකුළු කූඩු ආධාර සඳහා රු.108,000 ක් වැය කර තිබූණි. එයින් පැටවුන් 36 ක් කුඩා අවධියේදීම මියගොස් තිබූ අතර පැටවුන් 74 ක් ආර්ථික අපහසුතා නිසා නඩත්තු කර ගැනීමට නොහැකිව ප්‍රතිලාභීන් විසින් විකුණා තිබුණි.

(v) මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය සභාව මගින් කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් පහත දැක්වෙන කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා අනාවරණය විය.

- 2012 ගම නැගුම ව්‍යාපෘතිය යටතේ නාඋල කණුමුලයාය අතුරු මාර්ගය සහ පිළිහුඩුගොල්ල ඉහළ බතලවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.1,960,000 ට ගිවිසුම් දෙකකට එළඹ එම මුළු මුදලම ගෙවා තිබුණි. මාර්ග දෙපස 3/4" ගල් මතු වී ගැලවී යන ස්වභාවයක් පැවතීම හා කොන්ක්‍රීට් මිශ්‍රණය ඇස්තමේන්තුගත ප්‍රමිතියට යොදා නොමැති බව කොන්ක්‍රීට් කළ මාර්ගවල ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. නාම පුවරුව සවිකර නොතිබුණු මාර්ගයකට රු.6,000 ක් ගෙවා තිබුණු බවද නිරීක්ෂණය විය.

- 2012 ගම නැගුම 'එක ගමකට එක් වැඩක්' වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ පිළිහුඩුගොල්ල පහළ හපුගහකන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා රු.980,000 ක් වැයකර තිබුණි. ඇස්තමේන්තුවට අනුව 1:2:4(¾") කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහා ¾" ගල් යෙදිය යුතු වුවද, ¾",1",1 ½" ප්‍රමාණයේ ගල් හා ගල්කුඩු මිශ්‍රණයක් සහිතව යොදා තිබීම හා මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් සඳහා යොදා තිබු ගල් අතින් ගැලවිය හැකි මට්ටමේ දුර්වල තත්ත්වයක පැවැතුණි.

- 2012 ගම නැගුම 'එක ගමකට එක වැඩක්' වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ මොරගහමඩ පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.961,982 ක් වැයකර තිබුණි. ගොඩනැගිල්ලේ වහළය ප්‍රමිතියකින් තොර ළලය සහිත දැව යොදා තිබීම නිසා එම දැව කෘමීන් විසින් විනාශකර තිබුණු අතර සමහර කොටස් දිරායාමට ලක්ව තිබුණි. ඒ වෙනුවෙන් රු.185,568 ක් වැය කර තිබුණි.

- 2012 ගම නැගුම 'එක ගමකට එක වැඩක්' වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ මිල්ලගහමුල තැන්න සහ කෝන්ගහවෙල බහුකාර්ය ගොඩනැගිලි ඉදිකිරීමේ කර්මාන්තය සඳහා එකතුව රු.1,960,000 ක් වැයකර තිබුණි. එක් ගොඩනැගිල්ලක් කළුගඟ යෝජනා ක්‍රමයට මායිම් වූ රක්ෂිතයක නිසි අනුමැතියකින් හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉදිකර තිබුණු අතර එම ගොඩනැගිලිවලට යොදා ඇති දැව සහ සවිකිරීම් උපකරණ ඇස්තමේන්තුවල දැක්වෙන ප්‍රමිතියට අනුකූල නොවූ බවත් එය පරීක්ෂා කිරීමකින් තොරව ගෙවීම් කර ඇති බවත් නිරීක්ෂණය විය.

**(ඇ) භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම**

2012 ගම නැගුම 'එක ගමකට එක වැඩක් ' වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද සේනාගම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය නිමකර ඒ සඳහා රු.965,398 ක් වැයකර තිබුණි. ගොඩනැගිල්ලේ වහළයට හා දොරවල් සඳහා යොදා තිබුණු එලය සහිත දැව, පිපිරීම් හා දිරායැම් වලට ලක් වී නිසි නිමාවකින් හා නිසි ප්‍රමිතියකින් තොරව තිබුණි. මි.මි.40 xමි.මි.40 x මි.මී.5 ප්‍රමාණයේ කෝණ යකඩ රාමුව සහිත කොටුදැල් ඉදිකිරීම වෙනුවෙන් ඇස්තමේන්තු කර එකී ප්‍රමාණයන් සඳහා ගෙවීම් කර තිබුණත්, මි.මි.35 x මි.මී.35 x මි.මී.4 ප්‍රමාණයේ කෝණ යකඩ යොදා තිබුණි. අවශ්‍යතාවයකින් තොරව බොරළු යොදා ගොඩනැගිල්ලේ වටපිල ඉදිකිරීම සඳහා රු.7,358 ක් ගෙවා තිබුණත්, එකී බොරළු සෝදා පාළුවට ලක් වී තිබුණි. මේ ආකාරයේ ප්‍රමිතියකින් තොරව සිදු කළ ඉදිකිරීම් වෙනුවෙන් රු.250,868 ක් ගෙවා තිබුණි.

**1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දිවිනැගුම ධීවර පසු අස්වනු තාක්ෂණික ව්‍යාපෘති ණය යොජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික පුහුණුව ලැබූ ප්‍රතිලාභීන් 2,675 ක් වෙනුවෙන් එක් ප්‍රතිලාභියෙකුට උපරිම රු.10,000 ක ණය ලබාදීම සඳහා 2012 වර්ෂයේදී රු.26,750,000 ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණි. මෙම අරමුදල චක්‍රීය ණය අරමුදලක් ලෙස ක්‍රියාත්මක කිරීමට උපදෙස් දී තිබුණු අතර මේ වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ලංකා බැංකුවත් සමග අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 ජනවාරි 31 දින වන විටත් බැංකුව විසින් ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිපාදන මුදලින් සියයට 35 ක් හෙවත් රු.9,250,000 ක් පමණක් ණය ලෙස නිකුත් කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දින වන විට සමාලෝචිත වර්ෂය සඳහා සළසා තිබුණු රු.26,750,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම අමාත්‍යාංශය විසින් වියදමක් ලෙස ගිණුම්ගත කර විසර්ජන ගිණුමේද දක්වා තිබුණි.

(ii) 2013 නොවැම්බර් 30 දින වන විට ප්‍රතිලාභීන් 1,674 ක් සඳහා රු.16,740,000 ක ණය ආධාර ලබා දී ඉතිරි රු.10,010,000 නැවත ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට

ලබාදී තිබුණි. නමුත් එම වියදම් නොකළ රු.මිලියන 10 නැවත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට ගෙන්වා ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 1.9 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල කොට්ඨාශවල අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් හරිතාගාර පැල තවාන් ඇති කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා අමාත්‍යාංශය විසින් රු.19,088,361 ක ප්‍රතිපාදන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය වෙත ලබා දී තිබුණි. එම තවාන් සඳහා එළවළු හා පළතුරු පැල මිලදී ගැනිම සඳහා ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන දැන්වීම ප්‍රකාරව ලංසු කැඳවීමේ අවසාන දිනය එනම් 2012 ඔක්තෝබර් 12 දිනයට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කළ යුතු වුවත්, එදිනට පසුව එනම් 2012 ඔක්තෝබර් 19 දින ආයතනයට ලැබී තිබුණු ලංසුද බාර ගෙන තිබුණි.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු වැසීමත් සමඟ හැකිතාක් ඉක්මණින්, ලංසුකරුවන් හෝ පැමිණීමට කැමැති ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කළ යුතු වුවත්, 2012 ඔක්තෝබර් 12 දින වසන ලද ලංසුව දින 09 ක ප්‍රමාදයකින් පසුව 2012 ඔක්තෝබර් 21 දින විවෘත කර තිබුණි.
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවකට මිල කැඳවුම් ක්‍රමය යටතේ මිලදී ගත හැකි උපරිම වටිනාකම රු.500,000 ක් වුවත්, එම සීමාව ඉක්මවා බිබිල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.1,634,885 ක් වටිනා පලතුරු පැලද, බඩල්කුඹුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින්

රු.5,002,000 ක් වටිනා එළවළු පැලද මිල කැඳවුම් ක්‍රමය යටතේ සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබුණි.

(ii) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 2 ක් ඉක්මවූ මාතෘ සායන 17 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තු 17 ක් පිරිනමා තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව ඇස්තමේන්තු වටිනාකමෙන් සියයට 5 කට නොඅඩු මුදලකට කාර්යසාධන සුරක්ෂණයන් ලබා ගත යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම කොන්ත්‍රාත්තු 17 වෙනුවෙන් එසේ සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

(iii) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කළ කිරිමැටිය උස්සාන ජල යෝජනා ක්‍රමයට ජලය ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා එක්තරා වර්ගයක 3 ´ Type 6000 pvc නලයක් රු.4,500 බැගින් ඇස්තමේන්තු කර එම කොන්ත්‍රාත්තුව ග්‍රාම සංවර්ධන සමිතියට ප්‍රදානය කර තිබුණි. එම වර්ගයේ 3´ Type 6000 pvc නලවල වෙළඳපොල මිල රු.2,600 ක් වී තිබුණි. එම සමිතිය විසින් කොන්ත්‍රාත්තුව නිම කර ගෙවීම් කිරීමේදී එම PVC නලවල වෙළෙඳපොල මිල කෙරෙහි අවධානය යොමු නොකර ඇස්තමේන්තු පිළියෙල කිරිම නිසා රු.116,533 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) 2009 අංක 65 දරන වන සංරක්ෂණ (සංශෝධන) පනතින් සංශෝධිත වන සංරක්ෂණ ආඥා පනතේ (451අධිකාරය) 2.1. (ජ) උප වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වල පාරවල් සහ පස් කැපීමේදී අවසර ලබා ගත යුතුය. එසේ වුවත් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සංරක්ෂිත කැලෑවක ඇති කාල්කන්න කල්ගහ අංග කුඹුර මාර්ගය දළ වශයෙන් ඝන මීටර් 558 ක පමණ පස් කපා ඉවත්කර මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් පූර්ව අවසරයක් ලබා නොතිබුණු නමුත් ඒ සඳහා 2012 ජූනි 06 දින අදාල කොන්ත්‍රාත්කරු වෙත රු.1,250,420 ක් ගෙවා තිබුණි.

(v) 2011 ජූනි 10 දිනැති අංක MED/RE/A-SEE/AI/U දරන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියේ 4 වන ඡේදයට අනුව ආරක්ෂිත දැල් ගෘහයක් ඉදිකිරීමේ ඇස්තමේන්තුගත මුදලින් සියයට 50 ක උපරිමයක මුදල් ප්‍රදානයක් ප්‍රතිලාභියාට ලබාදීමට හැකි අතර ඉතිරි සියයට 50 ක වියදම ඔහුගේ පෞද්ගලික මුදලින් දැරිය යුතු බව දක්වා තිබුණි. ගෘහය ඉදිකිරීමේ ඇස්තමේන්තුගත මුදල රු.110,770 ක් වී තිබුණු අතර එම ඇස්තමේන්තුව

අනුව එක් ප්‍රතිලාභියෙකුට ලබා දිය යුතු මුදල් ප්‍රදානය රු.55,385 ක් විය. නමුත් ප්‍රතිලාභියෙකුට රු.84,000 ක් බැගින් මුදල් ප්‍රදාන ලබා දී තිබීම නිසා එක් ප්‍රතිලාභියෙකුට රු.28,615 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 53 දෙනෙකුට රු.28,615 බැගින් රු.1,516,065 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**1.10 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් පාඩු හා හානි නිරීක්ෂණය විය.

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධ රඹුටන් පැලයක අනුමත මිල රු.150 ක් වූ අතර මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පැලයක් රු.280 බැගින් ණය පදනම මත මිලදී ගැනීම නිසා ගෙවීම් කිරීමේදී රු.1,066,000 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිවිනැගුම වැඩසටහන යටතේ පලතුරු පැල මිලදී ගැනීම හා බෙදාහැරීම මගින් ඉහල බෙලිගල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ එක් ප්‍රතිලාභියෙකුට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් නිර්දේශ නොකරන ලද ගස්ලබු පැල 400 ක් ලබාදී තිබුණි. රෝගයක් සෑදීමෙන් පැල සියල්ල ගලවා ඉවත් කර තිබුණු අතර ඒ සඳහා වැය කළ රු.16,000 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි.

**1.11 අනාර්ථික ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විලාත, පල්ලේගම මාතෘ සායනය රු.2,800,980 ක් වැයකර 2011 දෙසැම්බර් මාසයේදී අළුත්වැඩියා කර තිබුණත්, එම මාතෘ සායනයට විදුලි සම්බන්ධතාවය ලබා නොගැනීම නිසා 2012 දෙසැම්බර් වන විටත් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2012 ජූනි මාසයේදී ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිදුකරන ලද අස්ගිරිය නැගෙනහිර පෙර පාසල සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේදී වැඩ විෂය අංක 6 ට අනුව පස් පිරවීම හා තැලීම වෙනුවෙන් 169 $m^3$ සඳහා රු.103,433 ක් ගෙවා තිබුණු අතර අයිතමය මැනීමේදී 100 $m^3$ වැඩිපුර මැනීම නිසා රු.64,135 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක ව්‍යාපෘති 567 ක් සඳහා 2011 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කළ ගමනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අභ්‍යන්තර චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව පොදුකාර්ය වියදම් රු.39,706,049 ක් හා ලාභය රු.39,706,049 ක් ලෙස එකතුව රු.79,412,098 ක් ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි.

## 1.12 කළමනාකරණ දුර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගම්පහ රන් අරුණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම්වල පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ගිවිසුමට එළඹි දිනය සඳහන් කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්තුව අවසන් කළ දිනයට පසු දිනවල කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම හා කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකර තිබුණි.

(iii) පූර්ව අනුමැතියකින් තොරව ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුගෙන් පරිබාහිර පාර්ශවයක් මගින් කොන්ත්‍රාත්තුව ඉටු කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 215(3)(සී) ප්‍රකාරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සුළු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති 48 ක් සඳහා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.48,816,717 ක් ලබා දී තිබුණි. 2011 ජුනි 16 දිනැති අංක MED/5/TRE/PD/2010 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලිපිය මගින් එම ව්‍යාපෘති වෙනුවෙන් වැය කර ඉතිරිවන මුදල රාජ්‍ය ආදායමට බැර කරන ලෙස දන්වා තිබුණත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ ඉතිරි වූ රු.2,922,974 ක් රාජ්‍ය ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) මාතර කාලිදාස පාරේ මාතෘ සායනය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ලංසුකරුවන් තිදෙනෙකු ඉදිරිපත් කළ ලංසු අතරින් අවම මිල වූ රු.6,402,040 ක ලංසුව තෝරා නොගෙන ඊට වැඩි රු.7,366,118 ක්වූ ලංසුව ඉදිරිපත් කළ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් රු.1,504,986 ක් වන අමතර ඇස්තමේන්තුවක් සකස් කර කොන්ත්‍රාත් පිරිවැය රු.7,906,946 දක්වා වැඩිකර ඉදිකිරීම් කර තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත පිරිවැය රු.7,611,014 ක් විය. කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු පිරිවැය රු.295,935 කින් ඉක්මවීම හා කොන්ත්‍රාත්තුවට එළඹ තිබුණු වටිනාකම ඉක්මවා රු.1,504,986 ක අමතර ඇස්තමේන්තුව සඳහා අනුමැතියක් ලබා නොගෙන ගෙවීම් කර තිබුණි.

(iii) අවම මිල ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලෙස එම ලංසුකරු වෙත ඒ වනවිට කොන්ත්‍රාත් 05 ක් ඉටු කිරිමට පැවති බව සඳහන් කර තිබුණු නමුත් කොන්ත්‍රාත්තුව පිරිනැමූ කොන්ත්‍රාත්කරු සතුව ඒ වනවිට ඉටු කිරිමට කොන්ත්‍රාත්තු 04 ක් පැවති අතර, කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුව මාස 06 ක ප්‍රමාදයකින් පසුව ඉටු කර තිබුණි.

(iv) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය යටතේ කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු පිළියෙල කර තිබුණත්, එම ඇස්තමේන්තුව නිවැරදි නොවූ බැවින් අමතර ඇස්තමේන්තු පිළියෙල කිරීමට සිදු වි තිබුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයේ සංවර්ධන ක්ෂේත්‍ර සහකාර ලෙස සේවය කළ අයෙකු 2010 සැප්තැම්බර් 29 දිනෙන් පසුව 2011 මාර්තු 30 දින දක්වා මාස 06 ක කාලයක් තුළදී දින 04 ක් පමණක් සේවයට වාර්තා කර තිබුණද, ඔහුට එම කාලයට අදාලව රු.174,452 ක වැටුප් ගෙවා තිබුණි. ගෙවන ලද වැටුපෙන් අයවිය යුතු ආපදා ණය වාරික රු.76,500 ක්ද අයකර ගැනිමට නොහැකි වි තිබුණි. මේ අනුව එම නිලධාරියාගෙන් එකතුව රු.250,952 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2011 සැප්තැම්බර් 01 දිනැති අංක දිවිනැගුම-2011 දරන මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ ලිපිය ප්‍රකාරව දිවිනැගුම වැඩසටහන සඳහා පැල මිලදී ගැනිම සම්බන්ධයෙන් වූ උපදෙස් පිළිබඳව සැලැකිලිමත් නොවීම මත බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩි මිලට පැල මිලදී ගැනිම නිසා රු.612,252 ක වැඩිපුර ගෙවා තිබුණි.

**1.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 746 | 592 | 154 | - |
| (ii) | තෘතියික මට්ටම | 6 | 3 | 3 | - |
| (iii) | ද්විතියික මට්ටම | 18,127 | 17,100 | 1027 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 251 | 206 | 45 | - |
| (v) | වෙනත්(අනියම්) | - | 15 | - | 15 |
| | එකතුව | 19,130 | 17,916 | 1,229 | 15 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,229 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණු අතර අනුමත තනතුරුවලට ඇතුළත් නොවූ අතිරික්ත සේවක සංඛ්‍යාව 15 ක් වී තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති "ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන භාර අරමුදලේ" සේවය කර පසුව 2011 අප්‍රේල් 18 දිනැති අංක MED/AD/E3/1/12(REii) දරන අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය මගින් අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සංවර්ධන අංශයට තාවකාලිකව අනුයුක්ත කර සිටි නිලධාරියෙකු චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය සුදුසුකම් නොමැතිව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ ඉංජිනේරු සහකාර /තාක්ෂණ නිලධාරියකු ලෙස බඳවාගෙන 2011 සැප්තැම්බර් 15 දින සිට 2013 සැප්තැම්බර් දක්වා දීමනා හා වැටුප් වශයෙන් රු.1,064,000 ක් ගෙවා තිබුණි.

## 2. ශීර්ෂය 218 - සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 26 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පාඩු හා හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| තැන්පතු ලෙජරය | මුදල් රෙගුලාසි 414 |
| බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 754 |
| වාහන ලේඛනය | මුදල් රෙගුලාසි 802 හා 1647 |
| වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645 (අ), 1647 (අ) සහ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41 /90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය |
| පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඇ) |

(ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු රු.5,350,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 31 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.81,094,154 ක් වූ අතර, එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 98 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) අයවැය සහාය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ ලබාගත් ප්‍රතිපාදන

එක් වැය විෂයයක් සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් සළසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව රු.1,000,000,000 ක පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් මගින් ප්‍රතිපාදන සළසාගෙන තිබුණත් ඉන් රු.46,811,344 ක් ඉතිරිකර තිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.5,879,061 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.841,783 ක් වූ අතර, එම මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 2.4.1 ඡේදයේ දැක්වෙන පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේනතුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 අගෝස්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. එසේම 2007 හා 2008 වර්ෂ වලට අදාල වාර්ෂික වාර්තා 2009 ඔක්තෝබර් 22 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

### 2.4.3 අභ්‍යන්තර විගණනය

සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 2.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 06 දිනැති අංක ඩීඑම්ඒ-2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව කාර්තුවකට එක් වරක් බැගින් අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් වාර 2 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

i) ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ වාහන 5 ක් වර්ෂ 02 සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ii) සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට අනුව භාණ්ඩ වර්ග 45 කට අයත් ඒකක 265 ක අතිරික්තයක්ද භාණ්ඩ වර්ග 8කට අයත් ඒකක 16 ක ඌනතාවයක්ද අනාවරණය වී තිබුණි. තවද ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබූ පරිදි භාණ්ඩ වර්ග 10 කට අයත් ඒකක 510 ක් නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. දෙපාර්තමේන්තුව විසින් එම අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2013 මැයි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණ අතර ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සමීක්ෂණ වාර්තා 2013 ජුලි 13 දින ඉදිරිපත් කර තිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම රු. | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| වාහන | 01 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | වටිනාකම තක්සේරු කර නොතිබුණි. | 1996 සිට |
| වාහන | 03 | සමෘද්ධි අමාත්‍යාංශය (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | වටිනාකම තක්සේරු කර නොතිබුණි. | 2002,2009 සහ 2012 |
| වාහන | 02 | ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | එම | 2009 සිට |

(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් ආයතන සතුව තිබුණු සමහර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | ඒකක ගණන | වටිනාකම රු. | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| වාහන | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 02 | වටිනාකම තක්සේරු කර නොතිබුණි. | 2010 සිට |
| වාහන | තරුණ කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශය | 01 | එම | - |
| වාහන | සැලසුම් ක්‍රියාත්මකකිරීමේ අමාත්‍යාංශය (දැනට නොපවතින) | 02 | එම | - |

(ඉ) පැවැත්ම තහවුරු නොවූ වාහන

දෙපාර්තමේන්තුව සතු වාහන 01 ක පැවැත්ම පිළිබඳ භෞතික පරීක්ෂාවේදී තහවුරු කරගත නොහැකි විය.

## 2.6 අනුකූල නොවීම

### නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නිති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | 476,020 | සේවය හැරගිය හා වැඩ තහනමට ලක් වූ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂය ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 571 (3) | 4,639,112 | ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් උපයාගෙන තිබූ ආදායමෙන් දරන ලද වියදම් අඩුකොට ඉතිරි මුදල, වසර 2 ක් ඉක්මවා තිබුණද රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 802 සහ 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | භාවිතා කළ නොහැකිව හා අළුත්වැඩියා කිරීමට නියමිතව ඇති වාහන 05 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ---------------------------- 1990 ඔක්තොබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | සෑම මාස 06 කට වරක් සියළු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. |
| (ඈ) ජාතික අයවැය චක්‍රලේඛ -------------------------------- 2004 ඔක්තොබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.7 ඡේදය | 485,878<br>609,509 | 2012 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 06 දෙනෙකුගේ රු.485,878 ක් සහ ස්ථානමාරු ලැබ පැමිණි නිලධාරීන් 03 දෙනෙකුගේ රු.609,509 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. |

2.7 අවිධිමත් ගනුදෙණු

----------------------

සමාජ ආරක්ෂණ අංශයට භාණ්ඩ නිකුත් කිරීම

----------------------------------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන සළසා නොතිබුණු, දෙපාර්තමේන්තුවේ ශීර්ෂයට අයත් නොවන සමාජ ආරක්ෂණ අරමුදල වෙත ලිපිද්‍රව්‍ය ඇතුළු අනෙකුත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විශාල ප්‍රමාණයක් මාසිකව, දෙපාර්තමේන්තුවේ ගබඩාවෙන් නිකුත් කර තිබුණි.

2.8 කළමනාකරණ දුර්වලතා

---------------------------

ආයතනයේ වාහනයක් අනතුරකට ලක් වී ධාවනයෙන් සම්පූර්ණයෙන්ම ඉවත්කර පරිශ්‍රයේ ගාල්කර තිබුණද, වාහනයේ ආදායම් බලපත්‍රය නිදහස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.9 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

----------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 44 | 22 | 22 |
| (ii) තෘතීයික මට්ටම | 19 | 15 | 04 |
| (iii) ද්විතීයික මට්ටම | 442 | 325 | 117 |
| (iv) ප්‍රාථමික මට්ටම | 98 | 72 | 26 |
| එකතුව | 603 | 434 | 169 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 169 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

3. ශීර්ෂය - 294 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

3.1 විගණන විෂය පථය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 15 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙණුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

3.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.2,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරි එකතුව රු.646,326,345 ක් වූ අතර, එම වැය විෂයයන්ට අදාලව ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 සිට සියයට 95 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂයය අංක 29401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,445,076 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) කේවල ණය ශේෂ ලේඛනය හා සැසඳුම් ප්‍රකාශයේ සඳහන් ණය ශේෂය අතර රු.20,505 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

3.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි. 2012 – 2016 කාලපරිච්ඡේදය වෙනුවෙන් පිළියෙල කර තිබුණු කෙටුම්පත් සංයුක්ත සැලැස්මක් 2011 නොවැම්බර් 22 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

3.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 3.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 ජූලි 07 දින පිළියෙල කර තිබුණි. එහෙත් එම ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් සංයුක්ත සැලැස්මට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

3.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 3.4.1 ඡේදයේ දැක්වෙන පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 සැප්තැම්බර් 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.4.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා නොතිබුණු අතර, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3.4.5 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2012 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(i) පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| ගෝනපල ගොවිපල | | |
| - සත්සඳ කූඩුව | 01 | දීර්ඝ කාලයක සිට |
| - ජල ටැංකිය - ලීටර් 1000 | 01 | වර්ෂ 01 |

(ii) 2008 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙහිවල සත්වෝද්‍යානයේ සත්ව කෞතුකාගාරයේ ප්‍රදර්ශනකුටි සැකසීම, සිවිලිම සවිකිරීම හා විදුලි රැහැන් ඇදීම සිදුකළ යුතුව තිබුණි. ඒ සඳහා 2008 වර්ෂයේ දී රු.1,565,160 ක් වැය කර තිබුණි. ඊට අමතරව 2010 වර්ෂයේදී එම ගොඩනැගිල්ල වායු සමීකරණය කිරීමට හා සේවා කිරීමට පිළිවෙලින් රු.3,950,592 ක් සහ රු.101,015 ක් වැයකර තිබුණි. නමුත් එම කෞතුකාගාරය 2013 නොවැම්බර්

30 දින වන විටත් නරඹන්නන් සඳහා විවෘත කර නොතිබුණි. සිවිලිම සකස් කිරීමට ප්‍රථම වහලයේ අළුත්වැඩියාවන් නිසි ලෙස සිදු නොකිරීම නිසා වර්ෂාවට තෙමීමෙන් සිවිලිම හානි වී තිබුණි. ඒ අනුව රු.5,616,767 ක වියදමක් කර තිබුණු එම කාර්යය 2013 නොවැම්බර් 30 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාකර ගෙන නොතිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 නොවැම්බර් 30 දින වනවිටත් සිදුකර නොතිබුණි. අවසන් වරට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර තිබුණේ 2010 වර්ෂය වෙනුවෙනි.

(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

දෙපාර්තමේන්තුව විසින් ගෝනපල පිහිටි ඉඩමක් විධිමත්ව පවරා ගැනීමෙන් තොරව ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා භාවිතා කර තිබුණි. මෙහි අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව අධ්‍යක්ෂවරයා ඔහුගේ පිළිතුරෙහි දක්වා තිබුණි.

(ඈ) බේරුම් නොකළ බැරකම්

2012 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවත එන දෙපාර්තමේන්තුව විසින් බේරුම් නොකළ රු.26,416,608 ක් වූ බැරකම් පැවතුණි.

3.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

වත්තල මින්මැදුර ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 100 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එය ඉදිකිරීමට යෝජිත ඉඩම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පවරා නොතිබීම හේතුවෙන් එහි ඉදිකිරීම් කටයුතු ඉටු කළ නොහැකි වීම නිසා සළසා තිබූ ප්‍රතිපාදනය නිෂ්ඵල වී තිබුණි. 2011 වර්ෂයේදීද මේ වෙනුවෙන් රු.මිලියන 35 ක ප්‍රතිපාදන සළසා තිබුණත් එයද උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

වැය විෂය 2104 ගොඩනැගිලි හා ඉදිකිරීම් යටතේ උප විෂය 05 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඒ යටතේ පින්නවල නව සත්වෝද්‍යානය සංවර්ධනය සඳහා වෙන් කළ රු. මිලියන 240 න් රු.මිලියන 172.4 ක් ඉතිරිවී තිබුණි. සැලසුම් කළ පරිදි

ඉදිකිරීම් සිදු නොවීම හා හිටපු උපදේශක සමාගම වෙනස්කර නව උපදේශක සමාගමක් පත්කර ගැනීමට ප්‍රමාද වීම සහ බිල්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම නිසා මෙම ඉතිරිවීම් සිදු වූ බව සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂවරයා විසින් පිළිගෙන තිබුණි. තවද, හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 300 ක් වෙන්කර තිබුණද වැයකර තිබුණේ රු. මිලියන 34.7 ක් එනම් සියයට 11 ක් පමණි. අක්මුදල් නොලැබීම සහ උද්‍යානය වටා ඉදිකිරීමට නියමිත වූ තාප්පය හා වැට කෙබඳු ආකාරයකට සකස් විය යුතුදැයි අවසාන තීරණයකට එළඹීමේදී ගැටළු මතුවීම මේ සඳහා හේතු වී තිබූ බව අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| (i) | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ආපන ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම | 29,653,081 | 2011.06.30 | 2011.08.10 | 15,508,881 | මූලික සංකල්ප හා සැලසුම් වෙනස් කිරීමට සිදුවීම. |
| (ii) | පින්නවල නව සත්වෝද්‍යානයේ වැසි ජලය ක්‍රමවත්ව බැහැර කිරීමේ පද්ධතිය | 7,400,573 | 2010.05.20 | 2010.11.16 | 4,396,529 | -එම- |
| (iii) | පින්නවල නව සත්වෝද්‍යානයේ භූගත ජල ගබඩා ටැංකි ඉදිකිරීම | 82,879,438 | 2008.08.15 | 2010.06.15 | 9,728,004 | කොන්ත්‍රාත් කරු විසින් ඉදිකිරීම භාරදීමේ ප්‍රමාදය |
| (iv) | පින්නවල නව සත්වෝද්‍යානයේ පානීය ජලය බෙදාහැරීමේ පද්ධතිය ඉදිකිරීම. | 29,831,462 | 2009.11.20 | 2010.03.19 | 5,670,613 | -එම- |

(ඇ) ව්‍යාපෘති ඇස්තමේන්තු අගයන් වෙනස් කිරීම - වාගොල්ල නව සත්වෝද්‍යානය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිවි පොකුණ ඉදිකිරීමේදී එහි ඇස්තමේන්තු අගයට වඩා රු.7,062,393 ක් වූ අමතර වැඩද රු.7,862,452 ක් වූ වැඩ කොටස් අඩුවෙන්ද සිදුකර තිබුණි. මේ සඳහා වූ හේතු පරීක්ෂාවේදී උපදේශක සැලසුම් වෙනස්වීම මත ඉදිකිරීම්වල ස්වභාවය වෙනස් වී තිබූ බව නිරීක්ෂණය විය. පළමු උපදේශක විසින් පොකුණ පතුලට ජියෝ සින්තටික් නම් රෙදිවර්ගය භාවිතා කිරීමට යෝජනාකර තිබුණද දෙවනුව පත්කරන ලද උපදේශකයන් ඒ වෙනුවෙන් කොන්ක්‍රීට් භාවිතා කිරීමට තීරණය කිරීම එයට හේතු වී තිබුණි.

(ii) දිවි අරණ සකස් කිරීමට අදාල පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 25 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා විස්තරාත්මක ඇස්තමේන්තු සකස් කළ හැකි වුවද, එසේ නොකර හඳුනා නොගත් වැඩ (Provisional Sum)ලෙස ඇස්තමේන්තුව සකස් කර තිබුණි.

(iii) පානීය ජලය බෙදා හැරීමේ පද්ධතිය සඳහා වූ කාර්යයන්ට පරිබාහිරව රු.279,552 ක වැඩ කොටස් කර තිබූ අතර, එම කාර්යයන් සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීම යටතේද ගෙවීම් කර තිබුණි. මේ නිසා එකම කාර්යයකට දෙවරක් ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) සීමාව ඉක්මවා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම

---

වාගොල්ල නව සත්වෝද්‍යානයේ දිවි අරණ ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමග වූ ගිවිසුම් ගත වටිනාකම වූ රු.184,609,701 ක් වෙනුවෙන් ගෙවිය හැකි වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම රු.36,921,940 ක් වුවද, එම සීමාව රු.1,565,198 කින් ඉක්මවා ඒ සඳහා රු.38,487,138 ක් ගෙවා තිබුණි.

3.7 කාර්යසාධනය

---

2012 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

---

වාගොල්ල නව සත්වෝද්‍යානය ඉදිකිරීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1998 වර්ෂයේදී වාගොල්ල නව සත්වෝද්‍යානය ඉදිකිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාගොල්ල කෘෂිකර්ම ගොවිපලෙන් ඉඩම් හෙක්ටයාර 16.45 ක් පවරා ගෙන තිබුණද, එයින් ඉඩම් හෙක්ටයාර 4.15 ක් 2012 වර්ෂය අවසාන වන විටත් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබුණි. එම කොටසෙහි තවදුරටත් ගොවිපල පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ii) පවරාගත් ඉඩම් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට විකල්ප ඉඩම් හෝ ප්‍රතිපාදන ලබාදීමට දෙපාර්තමේන්තුව පොරොන්දු වී තිබුණද, 2012 වර්ෂය අවසාන වන විටත් එසේ සිදුකර නොතිබුණි.

(iii) 2001 වර්ෂයේදී රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත වාගොල්ල සත්වෝද්‍යානයෙහි ඉදිකිරීම් නවතා දමා තිබුණු අතර අමාත්‍ය මණ්ඩල තීරණයක් මත 2008 වර්ෂයේදී නැවත ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. එහිදී ඉඩම් අක්කර 104 ක් දක්වා සත්වෝද්‍යානය පුළුල් කිරීමට යෝජනාවී තිබූ නමුත්, 2012 දෙසැම්බර් 31 දින වන විටත් අනෙකුත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(iv) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පින්නවල නව සත්වෝද්‍යානය සකස් කිරීම අරමුණ වී තිබූ නමුත්, යෝජිත මුළු භූමි ප්‍රමාණය වූ අක්කර 104 සඳහා පිළිගත හැකි මූලික සැලැස්මක් හා විස්තරාත්මක සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) නරඹන්නන්ගේ පැමිණීම සහ ආදායම්

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ දෙහිවල සත්වෝද්‍යානය සහ පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි නරඹන්නන් සංඛ්‍යාව සහ එමගින් ලද ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) දෙහිවල සත්වෝද්‍යානය

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු. | | රු. |
| දේශීය | 1,412,062 | 110,039,210 | 1,689,755 | 130,922,050 |
| විදේශීය | 21,188 | 25,108,000 | 20,446 | 25,178,750 |
| එකතුව | 1,433,250 | 135,147,210 | 1,710,201 | 156,100,800 |

දෙහිවල සත්වෝද්‍යානයට පැමිණි විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සසඳනවිට පුද්ගලයින් 742 කින් හෙවත් සියයට 3.6 කින් වැඩිවී තිබුණු අතර, එමගින් ලද ආදායම රු.70,750 කින් හෙවත් සියයට 0.3 කින් වැඩිවී තිබුණි. නමුත් දේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව හා ආදායම පිළිවෙලින් පුද්ගලයින් 277,693 කින් සහ රු.20,882,840 කින් අඩුවී තිබුණි.

(ii) පින්නවල අලි අනාථාගාරය

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම | පැමිණි නරඹන්නන් සංඛ්‍යාව | නරඹන්නන්ගෙන් ලද ආදායම |
| | | රු. | | රු. |
| දේශීය | 497,157 | 36,083,510 | 463,982 | 34,053,050 |
| විදේශීය | 266,297 | 455,554,750 | 264,452 | 448,625,000 |
| එකතුව | 763,454 | 491,638,260 | 728,434 | 482,678,050 |

2012 වර්ෂයේ දේශීය හා විදේශීය නරඹන්නන්ගේ සංඛ්‍යාව 2011 වර්ෂය හා සැසඳීමේදී පිළිවෙලින් සියයට 7 කින් හා සියයට 0.7 කින්ද ආදායම පිළිවෙලින් සියයට 5.9 කින් හා සියයට 1.5 කින්ද වර්ධනය වී තිබුණි.

3.8 අවිධිමත් ගනුදෙනු

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.14.1 ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව දෙහිවල සත්වෝද්‍යාන ආපනශාලාව සඳහා රු.843,325 ක් වැයකර දැව භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

3.9 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) පින්නවල වාගොල්ල ඉදිකෙරෙමින් පවතින නව සත්වෝද්‍යානයේ සැලැසුම වෙනස් කිරීම නිසා නව සැලසුමට අනුව සකස් කිරීමේදී පැරණි සැලැසුම අනුව සකස් කර තිබූ ලේනුන් සඳහා වූ කූඩු 04 ක් කුරුල්ලන් සඳහා වූ කූඩු, මීමින්නා අරණ, ඌරුමුව (Hog deer), හිවල් (Jackals) හා උරුලෑ (Civets) යන සතුන් සඳහා වූ අරණ කඩා ඉවත් කර තිබුණි. මේ නිසා එම කූඩු සකස් කිරීම සඳහා දරන ලද අමුද්‍රව්‍ය පිරිවැය, උපදේශක ගාස්තු හා එම ඉදිකිරීම් කඩා ඉවත් කිරීමේ ගාස්තු වූ රු.9,466,569 ක් නිෂ්කාර්ය වියදම් බව අනාවරණය විය.

(ii) දෙහිවල සත්වෝද්‍යානයේ ආපන ශාලාවේ නවීකරණ ඇස්තමේන්තුවට අමතරව සාද සඳහා වූ විදුලි ලාම්පු ඇතුළු විදුලි වැඩකටයුතු වෙනුවෙන් රු.1,967,991 ක් ද වැයකර තිබූ අතර, රාත්‍රී කාලයේ සාද පැවැත්වීමට හැකියාවක් නොමැති සත්වෝද්‍යානය තුළ සාද සඳහා වූ විදුලි ලාම්පු සවිකිරීම නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(iii) සත්වෝද්‍යානයේ අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතියේ සැලැසුම් වෙනස් කිරීම නිසා ඒ සඳහා 2010 වර්ෂයේදී වැය කළ රු.498,770 ක උපදේශක ගාස්තුව ඵලදායී නොවන වියදමක් වී තිබුණි.

3.10 කළමනාකරණ දුර්වලතා

පින්නවල අලි අනාථාගාරයෙන් අලි ඇතුන් සඳහා අවශ්‍ය සත්ව ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව 2012 ජූලි 31 දිනට අවසන්වීමට නියමිතව තිබුණු අතර, නැවත සැපයුම්කරුවකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකර තිබුණේ 2012 ජූනි 27 දින දීය. මෙම ප්‍රමාදය හේතුවෙන් නව කොන්ත්‍රාත් කාලය 2012 නොවැම්බර් 01 දින සිට 2013 ඔක්තෝබර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර, එතෙක් පෙර වර්ෂයේ සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත් කාලය වරින් වර දීර්ඝ කර තිබුණි. රුපියල් මිලියන 100 කට අධික වටිනාකමක් ඇති මෙම කොන්ත්‍රාත්තුව නියමිත කාලයේදී සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

3.11 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යේෂ්ඨ මට්ටම | 25 | 14 | 11 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 108 | 75 | 33 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 574 | 232 | 342 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | - | 39 | - | 39 |
| | එකතුව | 709 | 361 | 387 | 39 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 387 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂය 305 - උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

### 4.1 විගණන විෂය පථය

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 12 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් පත් අනුව උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

වැය විෂයයන් 06ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන්, ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8ත් සියයට 55ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 30501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබූ, 2012 මාර්තු 22 දින වැඩ තහනමකට ලක්වූ සේවකයෙකුගෙන් අයවිය යුතු රු.137,120ක වැටුප් ණය 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

## 4.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 4.4.1 ඡේදයේ දැක්වෙන පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව සඳහා අනුමත රු.මිලියන 1.2ක මූලධන ප්‍රතිපාදන සඳහා පමණක් ආවරණය වන පරිදි ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණි.

**4.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

ඉහත 4.4.1 ඡේදයේ දැක්වෙන පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාලව කාර්යසාධන වාර්තාව 2013 ජූලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**4.4.4 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**4.4.5 විගණන හා කළමනාකරණ කමිටුවේ ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

දෙපාර්තමේන්තුව සතු වාහනයක් අබලන්වීම නිසා 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | | වත්කම් ඒකක ගණන | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. |
| (i) | ගොඩනැගිලි | 02 | ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය | ගණනය කර නැත |
| | | 01 | දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරිය-මොනරාගල පිහිටි සංචාරක බංගලාව | -එම- |
| (ii) | වාහන | 01 | ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය | 188,233 |

(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් දීර්ඝකාලීන බදු පදනම මත ලබාගත් ඉඩමක දෙපාර්තමේන්තුවේ වියදමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

## 4.6 කාර්යසාධනය

මූලික කාර්යයන් 06ක් ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම කිසිදු කාර්යයක් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූලධන හා පුනරාවර්තන කටයුතු සඳහා වෙන් කර තිබුණු රු.17,340,000ක ප්‍රතිපාදනයෙන් රු.16,115,000ක් හෙවත් සියයට 93.5ක් පුද්ගල පඩිනඩි හා අනෙකුත් පරිපාලන වියදම් වෙනුවෙන් වැයකර තිබුණි.

## 4.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 04 | 02 | -- |
| (ii) | තෘතියික මට්ටම | 01 | -- | 01 | -- |
| (iii) | ද්විතියික මට්ටම | 37 | 19 | 18 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 07 | 04 | -- |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -- | 01 | -- | 01 |
| | එකතුව | 55 | 31 | 25 | 01 |

## 5. ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

### 5.1 විගණන විෂය පථය

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 04 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 5.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය .

**(අ) අයවැය විචලනය**

මූලධන වැය විෂයක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ක් වී තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය**

විෂය අංක 32201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.200,675 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 5.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 5.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

ක්ෂ මුදල් අධ්‍යදරන රාජ්‍ය (4)5/3//2/2/ආර්/දිනැති අංක පීඑෆ් 2010 මාර්තු 10 ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජූලි 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි.

### 5.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5.5 වත්කම් කළමනාකරණය

වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

මීරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ හෙක්ටයාර් 12 ක ඉඩම් ප්‍රමාණයක් වසර 03 කට අධික කාලයක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් ඒකක 5 කට අදාල එම වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන ඇති වත්කම්**

හක්ගල උද්භිද උද්‍යානයට අයත් හෙක්ටයාර් 20 කට අධික බිම් ප්‍රමාණයක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර එසේ අනවසරයෙන් අල්ලාගත් මුළු බිම් ප්‍රමාණය නිශ්චය කර නොතිබුණි.

**5.6 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවිස්සාවෙල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ 2012 දෙසැම්බර් 15 දිනට ඉදිකිරීම් කටයුතු නිමකළ යුතුව තිබුණු ප්‍රවේශ ගොඩනැගිලි, අමුත්තන්ගේ ශාලාව, වැසිකිළි පද්ධති හා අනෙකුත් අභ්‍යන්තර ඉදිකිරීම් විගණන දිනය වූ 2013 ජනවාරි 17 දින වන විටද නිමකර නොතිබුණි.

(ආ) ගම්පහ උද්භිද උද්‍යානයේ 2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත්ව තිබුණු රු.3,995,000 ක් වූ කාර්යයන් 02 ක් 2013 මාර්තු 15 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

(ඇ) ගම්පහ උද්භිද උද්‍යානයට ගම්පහ - ජාඇල මාර්ගය ඔස්සේ පිවිසීම සඳහා අත්තනගලු ඔය හරහා පාලමක් ඉදිකිරීමට යෝජිතව තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද එය ඉදිකර නොතිබුණු අතර, ඒ හේතුවෙන් 2013 මාර්තු 15 දින වනවිට වසර දෙකට පමණ පෙර ඉදිකර තිබුණු නව පිවිසුම් ගේට්ටුව සහ ප්‍රවේශ පත්‍ර කවුළුව ද උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ, කොන්ත්‍රාත් වටිනාකම රු.4,072,667 ක් වූ ගිම්හාන කුටි 04 ක් ඉදිකිරීම 2012 ජූනි 28 දින වනවිට නිමකළ යුතුව තිබුණද, 2013 ජනවාරි 22 දින වන විටද එම ඉදිකිරීම් නිමකර නොතිබුණි.

(ඉ) මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ අර්ධ කවාකාර සෙවණ ගෘහය ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී රු.1,254,590 ක් ද 2012 වර්ෂයේදී රු.64,280 ක් ද වශයෙන් එකතුව රු.1,318,870 ක් වැයකර තිබුණි. 2010 දෙසැම්බර් 28 දින වනවිට නිම කළයුතු සෙවණ ගෘහය ඉදිකිරීමේ කටයුතු 2013 ජනවාරි 22 දින වන විටද නිමකර නොතිබුණු අතර, සෙවණ ගෘහයේ සැකිල්ල පමණක් ඉදිකර වැඩ අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය.

## 5.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළයුතු ශේෂ

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව වසර 01 ට වැඩි 03 ට අඩු කාලපරාසයක සිට පැවත එන වෙනත් ගැලපීම්වල වටිනාකම රු.131,159 ක් විය.

## 5.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

හක්ගල උද්භිද උද්‍යානයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන ආපන ශාලාව වෙනුවෙන් 2007 අගෝස්තු 01 දින සිට 2013 ජූලි 31 දින දක්වා කාලය සඳහා ලැබී තිබුණු බදු ආදායම රු.1,053,900 ක් රජයේ ආදායමට බැර නොකර උද්භිද උද්‍යානයේ සේවක සුභ සාධක සමිතියේ අරමුදලට බැරකර තිබුණි.

## 5.9 කළමනාකරණ දුර්වලතා

හක්ගල උද්භිද උද්‍යානයේ කාර්යාල ගොඩනැගිල්ල, සේවක නිවාස, පොදු වැසිකිළි, ගබඩාව, ප්‍රවේශ පත්‍ර කවුළුව සහ මුර කුටි ඇතුළු විවිධ ස්ථානවල අලුත්වැඩියා කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 16 | 17 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 05 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 145 | 101 | 44 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 516 | 423 | 93 | - |
| (v) | වෙනත් ( කොන්ත්‍රාත් කම්කරු) | - | 116 | - | 116 |
| | එකතුව | 700 | 661 | 155 | 116 |

අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානය සඳහා අනුමත කාර්ය මණ්ඩයක් නොවූ අතර, යොදවා සිටි කාර්ය මණ්ඩලය උද්‍යානයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් වී නොතිබුණි.